(හත්වැනි පාර්ලිමේන්තුව — පළමුවැනි සභාවාරය)

අංක 374.]

# පාර්ලිමේන්තුවේ න්‍යාය පත්‍රය

## 2014 ජූලි මස 09 වැනි බදාදා අ. භා. 1.00 ට

## වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

2664/'12

1\.

ගරු සජිත් ප්‍රේමදාස මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මහින්ද චින්තන ඉදිරි දැක්මේ සඳහන් වන පරිදි ආගමික වශයෙන් වැදගත් වන අනුරාධපුරය, පොළොන්නරුව, කතරගම, මන්නාරම මඩු දේවස්ථානය වැනි ප්‍රදේශවල ආබාධිත රණවිරුවන් සඳහා නවීන ගිමන්හල් පද්ධතියක් ඉදිකිරීමට කටයුතු සලසා තිබේද;

(ii) එසේ නම්, එම ගිමන්හල් පද්ධතිය ඉදිකිරීමේ වැඩසටහනට අදාළ විස්තර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

3242/'12

2\.

ගරු රවි කරුණානායක මහතා,— ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) ලංකා ධීවර සංස්ථාවට අදාළව,

(i) 2012 වර්ෂයේ සිට අද දක්වා ලැබූ ලාභය හෝ අලාභය කොපමණද;

(ii) 2015 - 2016 වර්ෂ සඳහා අපේක්ෂිත ලාභය හෝ අලාභය කොපමණද;

(iii) අද වනවිට තිබෙන ප්‍රාග්ධන ප්‍රමාණය සහ සංචිත ප්‍රමාණය කොපමණද;

(iv) එම ආයතනයේ සේවය කරන පුද්ගලයින් සංඛ්‍යාව කොපමණද;

(v) එහි සේවක අතිරික්තයක් හෝ සේවක හිඟයක් තිබේද;

(vi) එම ආයතනය සේවකයෙකුට දරන වියදම සහ සේවකයෙකුගෙන් ලබන ලාභය කොපමණද;

(vii) කෙටි කාලීන ණය, බැංකු අයිරා, මධ්‍ය කාලීන සහ දිගු කාලීන ණය යනාදියෙහි මේ වන විට පවතින මුළු එකතුව කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

3449/'13

3\.
ගරු පී. හැරිසන් මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) විදුහල්පතිවරුන් හා ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ නිලධාරීන් බඳවා ගැනීමේ බලය මධ්‍යම රජයේ අධ්‍යාපන සේවා කොමිෂන් සභාව සතුවූවක්ද;

(ii) උතුරු මැද පළාත් සභා අමාත්‍ය මණ්ඩලය විසින් එම බලතල අභිභවමින් පළාත් අධ්‍යාපන සේවය සඳහා නිලධාරීන් බඳවා ගැනීමේ බලතල එම පළාත් සභාවට ලබා දී තිබේද;

(iii) නොඑසේ නම්, උතුරු මැද පළාත් අධ්‍යාපන කාර්යාලවල අනුයුක්ත ගුරු සේවයේ නිලධාරීන් විෂය අධ්‍යක්ෂ ධුර සඳහා බඳවා ගැනීම සිදුකර ඇති ක්‍රියා පටිපාටිය කවරේද;

(iv) පළාත් සභාව මගින් මධ්‍යම ආණ්ඩුවේ අනුමතියකින් තොරව බඳවා ගත් නිලධාරීන් සඳහා ගමන් වියදම් හා අමතර දීමනා ගෙවීම් සිදුකරන ආකාරය කවරේද;

(v) එම ගෙවීම් සිදුකරන්නේ උතුරු මැද පළාත් සභාවේ කවර වැය ශීර්ෂය යටතේද;

(vi) එම නිලධාරීන් සඳහා මුදල් ගෙවීම මධ්‍යම ආණ්ඩුවේ අධ්‍යාපන අමාත්‍යාංශයේ අනුමතිය යටතේ සිදුකරන්නේද;

(vii) එම මුදල් ගෙවීමේදී රජයේ මුදල් අයථා ලෙස භාවිත කොට තිබේ නම්, එසේ සිදුකළ නිලධාරීන්ට විරුද්ධව ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

3704/'13

4\.
ගරු අනුර දිසානායක මහතා,— ප්‍රවාහන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) මාතර සිට බෙලිඅත්ත දක්වා දුම්රිය මාර්ගයක් සකස් කිරීමට යෝජනා කර තිබේද;

(ii) එසේ නම්, එහි දුර ප්‍රමාණය කොපමණද;

(iii) එම දුම්රිය මාර්ගය ඉදිකිරීම සම්බන්ධයෙන් දැනට ගෙන ඇති ක්‍රියා මාර්ග කවරේද;

(iv) එම දුම්රිය මාර්ගය සකස් කිරීම වෙනුවෙන් දරනු ලබන සමස්ත පිරිවැය කොපමණද;

(v) එම පිරිවැය සපයා ගනු ලබන ආකාරය කවරේද;

(vi) එම පිරිවැය ණය මගින් සපයා ගනු ලබන්නේ නම්, ණය ලබා ගන්නා ආයතනය කවරේද;

(vii) එම ණය වෙනුවෙන් ගෙවිය යුතු පොලී අනුපාතය සහ ඊට අදාළ කොන්දේසි කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) මාතර - බෙලිඅත්ත දුම්රිය මාර්ගය ඉදිකිරීමේ කටයුතු පවරා ඇති සමාගම කවරේද;

(ii) එම සමාගම තෝරා ගනු ලැබීමේදී විධිමත් ටෙන්ඩර් පටිපාටියක් අනුගමනය කළේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

3739/'13

5.

ගරු බුද්ධික පතිරණ මහතා,— ආර්ථික සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) පිටබැද්දර ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශය තුළ කුඹුරු ඉඩම් ගොඩකරනු ලබන බවට ජනතාව චෝදනා කරන බව දන්නේද;

(ii) 2005 වර්ෂයේ සිට මේ දක්වා එම ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශය තුළ අනවසරයෙන් ගොඩකර ඇති කුඹුරු ඉඩම් ප්‍රමාණය කොපමණද;

(iii) එම අනවසර ගොඩකිරීම්වලට අදාළව පැමිණිලි ලැබී තිබේද;

(iv) එසේ නම්, ලැබී ඇති පැමිණිලි සංඛ්‍යාව කොපමණද;

(v) එම පැමිණිලි සම්බන්ධයෙන් පරීක්ෂණ පවත්වා නීත්‍යානුකූලව කටයුතු කර තිබේද;

(vi) ඒ අනුව ගෙන ඇති ක්‍රියා මාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) 2005 වර්ෂයේ සිට මේ දක්වා පිටබැද්දර ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශය තුළ කුඹුරු ඉඩම් ගොඩකිරීමට නීත්‍යානුකූල අවසරය ලබාගෙන තිබේද;

(ii) එසේ නම්, ගොඩකිරීම සඳහා අවසර ලබා දී ඇති කුඹුරු ඉඩම් ප්‍රමාණය කොපමණද;

(iii) එම කුඹුරු ඉඩම් ගොඩකිරීමට අවසර ලබා දීමට හේතු කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

4320/'13

6.

ගරු අනෝමා ගමගේ මහත්මිය,— සමූපකාර හා අභ්‍යන්තර වෙළඳ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) 2013 වර්ෂයේ අගෝස්තු මස අවසානය වන විට දිවයිනේ වී ගබඩාවල තිබූ වී තොග ප්‍රමාණය කොපමණද;

(ii) එම වී තොග පසුගිය මහ කන්නයේ මිලදී ගනු ලැබූ ඒවාද;

(iii) නොඑසේ නම්, ඊටත් වඩා පැරණි වී තොග එම ගබඩා තුළ තිබුණේද;

(iv) එම වී තොග ජනතාවගේ පරිභෝජනය සඳහා නිකුත් නොකිරීමට හේතු කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) 2013 වර්ෂයේ යල කන්නය සඳහා අපේක්ෂා කරන ලද වී අස්වැන්න කොපමණද;

(ii) එම අස්වැන්න මිලදී ගැනීමට හා ගබඩා කිරීමට සැලසුම් කරනු ලැබුවේද;

(iii) එම වැඩසටහන කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

4416/'13

7.

ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා,— විදුලිබල හා බලශක්ති අමාත්‍යතුමියගෙන් ඇසීමට,— (2)

(අ) (i) නොරොච්චෝලේ විදුලි බලාගාරයේ සිට අනුරාධපුරය දක්වා විදුලිය සම්ප්‍රේෂණය කරන කිලෝවොට් 220 අධි සම්ප්‍රේෂණ මාර්ගය ඉදිකිරීම නිසා අගතියට පත් පවුල් සංඛ්‍යාව කොපමණද;

(ii) එම සෑම පවුලකටම වන්දි ගෙවා තිබේද;

(iii) එලෙස ගෙවා ඇති වන්දි මුදල්වල වටිනාකම කොපමණද;

(iv) ඉහත සම්ප්‍රේෂණ මාර්ගය ඉදිකිරීමේදී මෙතෙක් වන්දි නොලැබුණු අවතැන්වූ පිරිසක් සිටින්නේද;

(v) එම පිරිසට වන්දි ගෙවීම ප්‍රමාදවීමට හේතු කවරේද;

(vi) ඉහත ව්‍යාපෘතියට අදාළව ගෙවිය යුතු සියලුම වන්දි මුදල් ගෙවා අවසන් කිරීමට ගතවන කාලය කොපමණද;

යන්න එතුමිය මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

4486/'13

8.

ගරු තිස්ස අත්තනායක මහතා,— ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) වසරක් පාසා හලාවත මෝය ස්වභාවිකව ගොඩ වීම හේතුවෙන් එම ප්‍රදේශයේ ධීවර ජනතාව දැඩි අපහසුතාවයකට පත්වන බවත්;

(ii) මෝය ගොඩ වීම හේතුවෙන් මේ වන විට බෝට්ටු දියත් කිරීමේදී සිදු වූ අනතුරුවලින් පුද්ගල මරණ සහ බෝට්ටු විනාශවීම් රැසක් සිදුවී ඇති බවත් ;

එතුමා දන්නෙහිද?

(ආ) (i) හලාවත මෝය සංවර්ධනය කිරීම සඳහා මේ වන විට කිසියම් ක්‍රියා මාර්ගයක් ගෙන තිබේද;

(ii) හලාවත මෝය ගොඩ වීම පිළිබඳ සුදුසු පරීක්ෂාවක් සිදු කොට ඒ සඳහා ස්ථිර විසඳුමක් ලබා දීමට කටයුතු කරන්නේද;

(iii) එසේ නම්, ඒ සඳහා ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

(iv) එම ක්‍රියාමාර්ග තුළින් එකී මෝය සංවර්ධනය කිරීම සඳහා ගත වන කාල සීමාව කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

4664/'13

9\.
ගරු ඉරාන් වික්‍රමරත්න මහතා,— සෞඛ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) රජයේ රෝහල් වෙනුවෙන් ඖෂධ මිලදී ගැනීම සඳහා වගකිව යුතු ආයතනය/ ආයතන කවරේද;

(ii) රජයේ රෝහල් වෙත ඖෂධ බෙදා හැරීම සඳහා වගකිව යුතු ආයතනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) 2011, 2012 සහ 2013 වර්ෂවලදී රජයේ රෝහල්වල ඖෂධ හිඟයක් පැවතුණේද;

(ii) එසේ නම්, එකී වර්ෂවලදී ඖෂධවල හිඟයක් වාර්තා කළ රජයේ රෝහල්වල නම් කවරේද;

(iii) එකී ඖෂධ හිඟයන්ට හේතු කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

4740/'14

10\.
ගරු අශෝක් අබේසිංහ මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) කුරුණෑගල දිස්ත්‍රික්කයේ මේ වන විට වැසී ගොස් ඇති පාසල් සංඛ්‍යාව කොපමණද;

(ii) වැසී ඇති එම පාසල් ගොඩනැගිලිවලින් ප්‍රයෝජනයක් ලබා ගන්නේද;

(iii) නැවත ආරම්භ නොකරන පාසල්වල ගොඩනැගිලි වෘත්තීය පුහුණු වැඩසටහන් ආරම්භ කිරීම සඳහා ලබා දෙන්නේද;

(iv) එසේ නම්, එම දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

4805/'14

11\.
ගරු අබ්දුල් හලීම් මහතා,— රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) මහනුවර දිස්ත්‍රික්කයේ, අකුරණ ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශයට අයත් ග්‍රාම නිලධාරි වසම් 35 තුළ වෙසෙන දෙමළ කථා කරන බහුතර ජනතාව වෙනුවෙන් සේවය කිරීම සඳහා දෙමළ භාෂාවෙන් වැඩ කළ හැකි ග්‍රාම නිලධාරීන් පස් දෙනෙකු පමණක් පත් කර ඇති බව එතුමා දන්නෙහිද?

(ආ) ඉහත සඳහන් ග්‍රාම නිලධාරි වසම් 35 අතරින් දෙමළ කථා කරන ප්‍රජාව නියෝජනය කරන ග්‍රාම නිලධාරී වසම් 21 සඳහා දෙමළ භාෂාව කථා කළ හැකි ග්‍රාම නිලධාරීන් පත් කිරීමට කටයුතු කරන්නේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

4807/'14

12\.
ගරු (අල්හාජ්) ඒ. එච්. එම්. අස්වර් මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) උකුවෙල නගරය සහ අවට ප්‍රදේශවල ජීවත් වන ද්‍රවිඩ දරුවන්ට උසස් පෙළ දක්වා අධ්‍යාපනය ලැබීමට ද්‍රවිඩ මාධ්‍ය පාසලක් නොමැති බවත්;

(ii) දළ වශයෙන් 700 කට වැඩි ද්‍රවිඩ සිසු සිසුවියන් පිරිසකට අධ්‍යාපනය හැදෑරීමට හැකි පාසලක් ස්ථාපනය කිරීම සඳහා අවශ්‍ය ඉඩම් ප්‍රමාණය ලබාදීමට දෙමව්පියන් සූදානමින් සිටින බව දැනුම් දී ඇති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) උකුවෙල නගරය සහ ආශ්‍රිත වතු ප්‍රදේශවල ජීවත් වන ද්‍රවිඩ ළමුන්ගේ අධ්‍යාපන සුබ සාධනය වෙනුවෙන් ද්‍රවිඩ මාධ්‍ය පාසලක් ස්ථාපිත කිරීමට කටයුතු කරන්නේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

4867/'14

13\.
ගරු අජිත් මාන්නප්පෙරුම මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2014.02.19 දින ශ්‍රී ලංකා පොලිසියේ උසස් නිලධාරීන් සඳහා මෝටර් රථ ලබා දුන්නේද;

(ii) එසේ නම්, එම වාහන සංඛ්‍යාව කොපමණද;

(iii) ඒ සඳහා වැය කළ මුදල කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

2666/'12

14\.
ගරු සජිත් ප්‍රේමදාස මහතා,— මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මහින්ද චින්තන ඉදිරි දැක්මේ සඳහන් වන පරිදි රට පුරා විසිරී සිටින ත්‍රිරෝද රථ හිමියන්ට හා රියදුරන්ට සමාරක්ෂණ ක්‍රමවේදයක් හඳුන්වා දී තිබේද;

(ii) එලෙස සමාරක්ෂණ ක්‍රමවේදයක් හඳුන්වා දී තිබේ නම්, එම රක්ෂණ ක්‍රමයට අදාළ විස්තර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

3243/'12

15\.
ගරු රවී කරුණානායක මහතා,— විදුලි සංදේශ හා තොරතුරු තාක්ෂණ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) සීමාසහිත ශ්‍රී ලංකා ටෙලිකොම් සමාගමට අදාළව;

(i) 2012 වර්ෂයේ සිට අද දක්වා ලැබූ ලාභය හෝ අලාභය කොපමණද;

(ii) 2015 - 2016 වර්ෂ සඳහා අපේක්ෂිත ලාභය හෝ අලාභය කොපමණද;

(iii) අද වන විට තිබෙන ප්‍රාග්ධන ප්‍රමාණය සහ සංචිත ප්‍රමාණය කොපමණද;

(iv) එම ආයතනයේ සේවය කරන පුද්ගලයින් සංඛ්‍යාව කොපමණද;

(v) එහි සේවක අතිරික්තයක් හෝ සේවක හිඟයක් තිබේද;

(vi) එම ආයතනය සේවකයෙකුට දරන වියදම සහ සේවකයෙකුගෙන් ලබන ලාභය කොපමණද;

(vii) කෙටි කාලීන ණය, බැංකු අයිරා, මධ්‍ය කාලීන සහ දිගු කාලීන ණය යනාදියෙහි මේ වන විට පවතින මුළු එකතුව කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

---

# යෝජනා පිළිබඳ දැනුම්දීම සහ දිනට නියමිත කටයුතු

*1.

පරිසර හා පුනර්ජනනීය බලශක්ති අමාත්‍යතුමා,— සමුද්‍ර දූෂණය වැළැක්වීමේ පනත යටතේ නියෝග (අංක 1),— 2008 අංක 35 දරන සමුද්‍ර දූෂණය වැළැක්වීමේ පනතේ 6 වැනි වගන්තියේ (උ) ඡේදය සහ 39 වැනි වගන්තිය සමග කියවිය යුතු, 51 වැනි වගන්තියේ (2) වැනි උප වගන්තියේ (ඇ) ඡේදය යටතේ පරිසර අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2012 අගෝස්තු 15 දිනැති අංක 1771/19 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2014.06.18 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

*2.

පරිසර හා පුනර්ජනනීය බලශක්ති අමාත්‍යතුමා,— සමුද්‍ර දූෂණය වැළැක්වීමේ පනත යටතේ නියෝග (අංක 2),— 2008 අංක 35 දරන සමුද්‍ර දූෂණය වැළැක්වීමේ පනතේ 27 වැනි සහ 28 වැනි වගන්ති සමග කියවිය යුතු, 51 වැනි වගන්තිය යටතේ පරිසර හා පුනර්ජනනීය බලශක්ති අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2013 ජුනි 28 දිනැති අංක 1816/37 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද සහ 2013 සැප්තැම්බර් 27 දිනැති අංක 1829/38 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ නිවැරදි කර පළ කරනු ලැබ, 2014.06.18 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

*3.

ශ්‍රී ලංකා මූලික අධ්‍යයන ආයතනය (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*4.

කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යතුමා,— සමාගම් පනත සහ සමිති ආඥාපනත යටතේ නියෝග,— 2007 අංක 7 දරන සමාගම් පනතේ 477 හා 157(5) වැනි වගන්ති සමග කියවිය යුතු, 527 වැනි වගන්තිය යටතේ, සහ 2005 අංක 11 දරන සමිති ආඥාපනත (සංශෝධන) පනත සමග කියවිය යුතු, 1891 අංක 16 දරන (123 වැනි අධිකාරය වූ) සමිති ආඥාපනතේ 19 වැනි වගන්තිය යටතේ කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2013 දෙසැම්බර් 18 දිනැති අංක 1841/8 දරන අති විශේෂ ගැසට්පත්‍රයේ සහ 2014 ජනවාරි 27 දිනැති අංක 1847/2 දරන අති විශේෂ ගැසට්පත්‍රයේ පළ කරනු ලැබ, 2014.06.05 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*5.

පතල් හා ඛනිජ ද්‍රව්‍ය (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*6.

විදේශ කටයුතු අමාත්‍යතුමා,— ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ යෝජනාව (අංක 1),— 2011.09.07 වැනි දින ඉදිරිපත් කරන ලද ආයෝජන ප්‍රවර්ධන සහ අන්‍යෝන්‍ය වශයෙන් සුරක්ෂණය පිළිබඳ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුව සහ කුවේට් රාජ්‍යයේ ආණ්ඩුව අතර 2009 නොවැම්බර් මස 05 වැනි දින අත්සන් කරනු ලැබුවාවූ ද, එම විදේශ රාජ්‍යයේ හෝ එහි වැසියන්ගේ හෝ ඒ රාජ්‍යයේ නීති යටතේ සංස්ථාගත කරන ලද නැතහොත් සංස්ථාපනය කරන ලද සංස්ථාවල, සමාගම්වල හෝ වෙනත් සංගම්වල ශ්‍රී ලංකාව තුළ ආයෝජන වඩාලීම හෝ ආරක්ෂා කිරීම සඳහා ඇති කරගත්තාවූ ද ගිවිසුම, ජාතික ආර්ථිකයේ වර්ධනයට අත්‍යාවශ්‍යවන්නක් ලෙස අනුමත කළ යුතුයැයි ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 157 වැනි ව්‍යවස්ථාව ප්‍රකාර මෙම පාර්ලිමේන්තුව යෝජනා සම්මත කරයි.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*7.

විදේශ කටයුතු අමාත්‍යතුමා,— ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ යෝජනාව (අංක 2),— 2011.09.07 වැනි දින ඉදිරිපත් කරන ලද ආයෝජන ප්‍රවර්ධන සහ සුරක්ෂා කිරීම සඳහා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුව සහ වියට්නාම සමාජවාදී ජනරජයේ ආණ්ඩුව අතර 2009 ඔක්තෝබර් මස 22 වැනි දින අත්සන් කරනු ලැබුවාවූ ද, එම විදේශ රාජ්‍යයේ හෝ එහි වැසියන්ගේ හෝ ඒ රාජ්‍යයේ නීති යටතේ සංස්ථාගත කරන ලද නැතහොත් සංස්ථාපනය කරන ලද සංස්ථාවල, සමාගම්වල හෝ වෙනත් සංගම්වල ශ්‍රී ලංකාව තුළ ආයෝජන වඩාලීම හෝ ආරක්ෂා කිරීම සඳහා ඇති කරගත්තාවූ ද ගිවිසුම, ජාතික ආර්ථිකයේ වර්ධනයට අත්‍යාවශ්‍යවන්නක් ලෙස අනුමත කළ යුතුයැයි ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 157 වැනි ව්‍යවස්ථාව ප්‍රකාර මෙම පාර්ලිමේන්තුව යෝජනා සම්මත කරයි.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*8.

ප්‍රවාහන අමාත්‍යතුමා,— මෝටර් වාහන පනත යටතේ නියෝග,— (203 වැනි අධිකාරය වූ) මෝටර් වාහන පනතේ 5 වැනි වගන්තියේ (2) වැනි උපවගන්තිය සහ 19 වැනි වගන්තිය සමග කියවිය යුතු, එකී පනතේ 237 වැනි වගන්තිය යටතේ ප්‍රවාහන අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2013 ජුලි 31 දිනැති අංක 1821/31 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2013.11.22 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

*9.

කම්කරු හා කම්කරු සබඳතා අමාත්‍යතුමා,— සේවක අර්ථසාධක අරමුදල පනත යටතේ නියෝග,— කලින් කල සංශෝධිත 1958 අංක 15 දරන සේවක අර්ථසාධක අරමුදල පනතේ 46 වැනි වගන්තිය යටතේ කම්කරු සහ කම්කරු සබඳතා අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2013 මැයි 13 දිනැති අංක 1810/20 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2013.06.21 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*10.

ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍යතුමා,— හිමිකම් ලියාපදිංචි කිරීමේ පනත යටතේ නියෝග,— 1998 අංක 21 දරන හිමිකම් ලියාපදිංචි කිරීමේ පනතේ 60 සහ 62 වැනි වගන්ති සමඟ කියවිය යුතු, එකී පනතේ 67 වැනි වගන්තිය යටතේ ඉඩම් සහ ඉඩම් සංවර්ධන අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2009 අගෝස්තු 24 දිනැති, අංක 1616/23 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2010.05.06 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*11.

අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමා,— වනසත්ව හා වෘක්ෂලතා ආරක්ෂක ආඥාපනත යටතේ නියමය,— (469 වැනි අධිකාරය වූ) වනසත්ව හා වෘක්ෂලතා ආරක්ෂක ආඥාපනතේ 2 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ ගොවිජන සේවා හා වනජීවී අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2011 දෙසැම්බර් 06 දිනැති අංක 1735/21 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2011.12.13 දින ඉදිරිපත් කළ නියමය අනුමත කළ යුතු ය.

12.

ශ්‍රී ලංකා කාන්තා සම්මේලනය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — සලකා බැලීම.

13.

රණ කලා ආයතනය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — සලකා බැලීම.

14.

ද ඉන්ස්ටිටියුට් ඔෆ් සර්ටිෆයිඩ් පබ්ලික් එකවුන්ටන්ට්ස් (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — සලකා බැලීම.

15.

දාම්පේ, මීගොඩ බෝධිවර්ධනාරාම ශ්‍රී මධුරසාම පිරිවෙන් විහාරස්ථ සංවර්ධන සභාව (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — සලකා බැලීම.

16.

නිමල් සිරිපාල ද සිල්වා පදනම (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — සලකා බැලීම.

17.

ලක්ෂ්මන් වසන්ත පෙරේරා ප්‍රජා සංවර්ධන පදනම (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — සලකා බැලීම.

18.

අල් ජමියාතුල් හ්හව්සියා (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

19.

ද පේරන්ට්ස් පදනම (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

20.

ආසියානු ජපන් ශ්‍රී ලංකා හා ඇමෙරිකා ජර්මනි, සමාජයීය ආර්ථික හා මානව සම්පත් සංවර්ධන ජාත්‍යන්තර පදනම (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

21.

අල් - ජාමිඅතුල් ඉස්ලාමියියා අරාබි විද්‍යාලය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

22.

ශ්‍රී ලාංකීය උරුමයන් පදනම (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

23.

සංවර්ධන පහසුකම් සැලසීමේ ශ්‍රී ලංකා මධ්‍යස්ථානය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

24.

වල්පොල පියානන්ද අධ්‍යාපන සහ සංස්කෘතික පදනම (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*** සලකුණෙන් හඳුන්වනු ලබන්නේ ආණ්ඩුවේ කටයුතු ය.**